# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION

## <u>මාධ්‍ය නිවේදනයයි</u>

අද දින රඹුක්කන ප්‍රදේශයේදී ඇති වූ මහජන නොසන්සුන්තාවය අතරතුරදී එක් පුද්ගලයෙකු පොලිස් වෙඩි පහරකින් ජීවිතක්ෂයට පත්වීම හා තවත් පුද්ගලයින් 24 දෙනෙකු තුවාල ලබා රෝහල්ගත කිරීමට සිදුවීම පිළිබඳව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විශේෂ අවධානය යොමු වී ඇත.

මහජන මතයට සාවධානව ඇහුම්කන් දෙමින් බුද්ධිමත්ව හා ඉවසීමෙන් කටයුතු කළ යුතු බවට අප සංගමය විසින් දිගින් දිගටම රජය වෙත දැඩිව කරුණු අවධාරණය කරන ලද නමුත්, රජය තවදුරටත් එම කරුණු නොසලකා කිසිදු සංවේදීභාවයකින් තොරව කටයුතු කරන බව නිරීක්ෂණය වේ.

දැඩි ආර්ථික දුෂ්කරතාවලින් හා මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ අපහසුතාවයන් හේතුවෙන් බලවත් පීඩාවට හා නොසන්සුන්තාවයට පත් වී සිටින ජනතාවට සහන සලසනු වෙනුවට ඔවුන්ගේ ජීවත්වීමේ අයිතිය ද උදුරා ගැනීමේ පියවරකට මුල පිරීම කිසිසේත් ම අනුමත කළ නොහැකි අතර මෙම සිදුවීම ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය වශයෙන් දැඩි පිළිකුළෙන් යුතුව තරයේ හෙළා දකිමු.

මෙම සිද්ධිය සම්බන්ධව වහාම ස්වාධීන පරීක්ෂණයක් සිදු කරන ලෙස රජයේ අදාළ බලධාරීන් වෙත බල කර සිටින අතර, මෙම සිද්ධියේ දී පොලිස් නිලධාරීන් තම බලය ඉක්මවා කටයුතු කොට ඇත්නම් ඔවුන් සම්බන්ධව කඩිනමින් නීතිය ක්‍රියාත්මක කරන ලෙස ද ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳව ජාත්‍යන්තර අවධානයට ලක්ව ඇති හා ශ්‍රී ලංකාව ස්වකීය මූල්‍ය අර්බුදයෙන් මිදීම සඳහා ජාත්‍යන්තරයේ සහය ඉල්ලා සිටින මෙවන් තීරණාත්මක මොහොතක, මෙවැනි අවාසනාවන්ත සිද්ධීන් සිදුවීමට ඉඩ හැරීම අප මාතෘ භූමිය ජාත්‍යන්තර වශයෙන් දැඩි අප්‍රසාදයට පත්වීමටත්, පවතින අර්බුදයෙන් මිදීම සඳහා ජාත්‍යන්තර සහය ලබා ගැනීමේ අවස්ථා ඇහිරී යාමටත් හේතු වේ.

මෙවැනි සිද්ධීන් නැවත ඇති නොවීමට රජය විසින් තරයේ වග බලා ගත යුතු බව දැඩි ලෙස අවධාරණය කරමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

**පදුල ශ්‍රී රෝහණ ද සිල්වා**
ගරු සභාපති

**ප්‍රදීප් ලක්ශාන්ත**
ගරු ලේකම්

**23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.** 23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**
දුරකතනය/ தொலைபேசி/Telephone : 011 5766855
ෆැක්ස්/தொலைநகல்/ Fax : 011 2058027
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ Email : sasa.execo@gmail.com
වෙබ් අඩවිය/இணையத்தளம்/ Web: www.sasa.lk